## 10.1 ව්‍යාපාර පරිසරය තුළ ප්‍රධාන වැරදි හා නව රෙගුලාසි

### 10.1.1 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත

- මෙම පනතේ පූර්විකාවේ දක්වා ඇති ආකාරයට මෙම පනත
- බුද්ධිමය දේපළ සඳහා බලපාන නීති පැනවීම
- බුද්ධිමය දේපළ ලියාපදිංචි කිරීමටල පාලනය කිරීම සහ විධිමත් කිරීම සඳහා කාර්යක්ෂම
- ක්‍රියාපටිපාටියක් නීතිය මඟින් හඳුන්වා දීම
- ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පිළිබඳ අධ්‍යක්ෂ ජෙනරාල් ධූරය ඇති කිරීම
- රේගු ආඥා පනත සහ පළාත්බද මහාධිකරණ විශේෂ විධි විධාන පනත සංශෝධනය කිරීම
- අනුශංගික කාරණා සම්බන්ධ නීති පැනවීම

අරමුණු කර ගනිමින් පනවන ලද පනතකි.

#### 10.1.1.1 බුද්ධිමය දේපළ නිර්වචනය හා පනත මගින් ආවරණය කොට ඇති බුද්ධිමය දේපළ

2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතේ අර්ථ නිරූපණ වගන්ති මඟින් බුද්ධිමය දේපළක් යන්න අර්ථ නිරූපනය කොට නොතිබුණ ද " බුද්ධිමය දේපළක් යනු මිනිසෙකු තම බුද්ධිය මෙහෙයවා කරනු ලබන නිර්මාණයක් " ලෙස අර්ථ ගැන්විය හැකිය.

ඕනෑම රටක ආර්ථික, සමාජයීය සහ තාක්ෂණික වර්ධනය උදෙසා අතිමහත් දායකත්වයක් බුද්ධිමය දේපළ සිදු කරයි. යම් නව නිර්මාණයක් කළ පුද්ගලයෙකුට එම නිර්මාණය උදෙසා නිශ්චිත කාල සීමාවකට ඒකාධිකාරී අයිතියක්, පරම අයිතියක් ලබා දීම හා නිර්මාණාත්මක ප්‍රයත්න ආරක්ෂා කිරීම තුළ නව නිර්මාණ කරණය දිරිමත් වේ.

ජාත්‍යන්තර වශයෙන් ලෝක බුද්ධිමය දේපළ සංවිධානය, යුනෙස්කෝ සංවිධානය, ලෝක වෙළඳ සංවිධානය, නව ප්‍රභේද ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සංගමය ආදී ජාත්‍යන්තර සංවිධාන බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර තලයේ කාර්යය භාරය ඉටු කරනු ලබන අතර දේශීය මට්ටම තුළ එම කාර්යය භාරය 2003 අංක 36 දරණ පනත මඟින් ස්ථාපනය කර ඇති ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මඟින් ඉටු කරයි.

2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතේ ආවරණය පහත බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් අදාළ වේ.

- ප්‍රකාශන අයිතිය
- කාර්මික සැලසුම්
- පේටන්ට් / ස්වාධිකාරය
- ලකුණු හා වෙළඳ නාම
- සංයුක්ත පරිපථයන් සඳහා වූ පිරියත සැලසුම්
- භූගෝලීය දර්ශක

### 10.1.1.2 ප්‍රකාශන අයිතිය

ශාස්ත්‍රීය, කලාත්මක හා විද්‍යාත්මක කාර්යයන්හි නිර්මාණ කරුවන්ට එකී නිර්මාණ සම්බන්ධයෙන් ඇති ආර්ථික හා සදාචාරාත්මක අයිතීන් ප්‍රකාශන අයිතීන් ලෙස හැඳින්විය හැකිය. පනතේ 06 වන වගන්තිය මගින් ආරක්ෂිත කාර්යයන් ලෙස දක්වා ඇති පහත දැක්වෙන ශාස්ත්‍රීය, කලාත්මක හා විද්‍යාත්මක නිර්මාණයන් සම්බන්ධයෙන් එහි නිර්මාණ කරුවන්ට ප්‍රකාශන අයිතීන් හිමි වේ.

- පොත්, පත්‍රිකා, ලිපි, පරිගණක වැඩසටහන් හා වෙනත් ලියවිලි
- කථා, දේශන, ඇමතීම්, අනුශාසනා සහ වෙනත් වාචික කෘති
- නාටකීය හෝ ගීත නාටකීය කෘති, අභිරූපන, නෘත්‍ය, විද්‍යාත්මක කෘති සහ වේදිකා නාට්‍ය
- ඉහත නාටකීය හෝ ගීත නාටකීය කෘති, අභිරූපන, නෘත්‍ය, විද්‍යාත්මක කෘති සහ වේදිකා
- නාට්‍ය කෘති වේදිකා ගත කිරීමට අදාළ නිෂ්පාදන සහ එවැනි නිෂ්පාදන සඳහා යෝග්‍ය
- ජනප්‍රවාද ප්‍රකාශන
- සංගීතය සමග ගයන වචන ඇතුළත් වන හෝ නොවන සංගීතමය කෘති
- ශ්‍රව්‍ය, දෘශ්‍ය කෘති
- ගෘහ නිර්මාණ ශිල්පීය කෘති
- චිත්‍ර, පින්තාරු කිරීම්, මූර්ති, කැටයම්, ලිතෝ මුද්‍රණ, විචිත්‍ර ගෙත්තම් සහ වෙනත් ලලිත
- කලාත්මක කෘති
- ඡායාරූප
- ව්‍යවහාරික කලා කෘති
- භූගෝල විද්‍යාව හා භූ ලක්ෂණ විද්‍යාව. ගෘහ නිර්මාණ ශිල්පය සම්බන්ධ සිතියම්. පිඹුරු. කටු
- සටහන් හා ත්‍රිමාණ කෘති
- කෘතිවල පරිවර්තන, අනුවර්තන, එකලස් කිරීම් හා වෙනත් විපර්යාසයන් හා විකරණයන්
- මුල් කෘතිවල එකතු සහ දත්ත පදනම්

ඉහත දක්වන ලද ආරක්ෂිත කෘතියක නිර්මාණකරුට එම කෘතිය ප්‍රතිනිෂ්පාදනය කිරීමට, විකිණීමට, කුලියට දීමට, බෙදාහැරීමට, මහජනයා වෙත සන්නිවේදනය කිරීමට, පරිවර්ථනය කිරීමට ඇති අයිතිය ආර්ථික අයිතිවාසිකම වන අතර අදාළ කෘතියට අදාළ කතෘත්වය සඳහා වූ හිමිකම් විකෘති කිරීමකට, කෘතිය විකෘති කිරීමකට, අංග ඡේදනයකට හෝ විකරණයකට හෝ හීන කාරක ක්‍රියාවකට විරෝධය පෑමේ අයිතිවාසිකම බුද්ධිමය දේපළට අදාළ සදාචාරාත්මක අයිතිවාසිකම වේ.

ව්‍යතිරේඛීය අවස්ථාවන්ට යටත්ව ප්‍රකාශන අයිතියක් කෘතිය මහජනයාට ඉදිරිපත් කළ දිනයේ සිට කාර්යය පටිපාටික අවශ්‍යතා රහිතව කර්තෘගේ ජීවිත කාලය තුළ හා ඔහුගේ මරණයෙන් වසර 70 ක කාලයක් පුරා බලපැවැත්වේ.

### 10.1.1.3 කාර්මික සැලසුම්

කාර්මික සැලසුමක් යනු යම් භාණ්ඩයක අලංකරණය හා සෞන්දර්යාත්මක ලක්ෂණ පිළිබඳව වූ සැලැස්මකි.
කාර්මික සැලසුම් සඳහා ආරක්ෂණ ලබා ගත හැක්කේ අලුත්ම එකක් නම් පමණි. ලියාපදිංචිය පිණිස අයදුම්පත ඉදිරිපත් කරන දිනය වන විට එය මහජනතාවට ප්‍රදර්ශනය වී හෝ ප්‍රවේශ වී නොතිබිය යුතුය.

කාර්මික සැලසුම් සඳහා ලියාපදිංචිය හිමි නොවන අවස්ථා ද පවතී. ඒවා නම්,යම් සමාජයක් තුළ ආගමක් හෝ ජාතියක් දෝෂදර්ශණයට ලක් කරන කාර්මික සැලසුම් නින්දිත, අපහාසාත්මක ස්වරූපයක් උසුලන හෝ සමාජයේ සදාචාරවත් භාවයට පටහැනි කාර්මික සැලසුම් ලියාපදිංචියෙන් අනතුරුව වසර 05 කාලයක් පුරාවට කාර්මික සැලසුමක් සඳහා ආරක්ෂාව සැපයෙන අතර ඉන්පසු වසර පහක කාල සීමා දෙකක් සඳහා ලියාපදිංචිය අලුත් කර ගත හැකිය.

එම ආරක්ෂිත කාල පරිච්ඡේදය තුළ සැලැස්ම යොදා ගනිමින් භාණ්ඩ සෑදීම, භාවිතා කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම සිදු කළ හැක්කේ සැලැස්මේ ලියාපදිංචි හිමිකරුට පමණි.

### 10.1.1.4 ස්වාධිකාරය / පේටන්ට්

නව නිමැවුමක නිර්මාණ කරුවාට එකී නිර්මාණය ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍රය යොමු කල දිනයේ සිට වසර 20 ක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු වන පරිදි එකී නව නිර්මාණය බිහි කිරීමට, අලෙවි කිරීමට හෝ ඒ සඳහා පවතින අයිතිය බැහැර කිරීමට ලබා දෙන ඒකාධිකාරී අයිතිය ස්වාධිකාරය හෙවත් පේන්ට් අයිතිය ලෙසින් හැඳින් වේ.

නව නිපයුමක් යන්න 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතේ 62 වන වගන්තිය මඟින් අර්ථ නිරූපණය කර ඇති අතර ඒ අනුව " තාක්ෂණික විද්‍යා ක්ෂේත්‍රයේ නිශ්චිත ගැටලුවක් විසඳීමට ව්‍යවහාරයෙහිලා උපකාර වන, නව නිපැයුම්කරුවෙකුගේ සංකල්පනාවක" නව නිපයුමක් වශයෙන් අර්ථ නිරූපණය කෙරේ.

කෙසේ නමුත් පහත නව නිපැයුම් සඳහා පේටන්ට් අයිතිය ලබා ගත නොහැකිය.

- අනාවරණ කරගැනීම්, විද්‍යාත්මක සිද්ධාන්ත සහ ගණිත ක්‍රම
- ශාක, සතුන්, ජාන සුසංයෝගී ක්ෂුද්‍ර ජීවීන් නොවන වෙනත් ක්ෂුද්‍ර ජීවීන් සහ ජීව විද්‍යාත්මක
- සහ ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක් නොවන ශාක සහ සතුන් නිෂ්පාදනය සඳහා වන අවශ්‍යයෙන්ම ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක්.
- ව්‍යාපාර කටයුතු කිරීම, හුදු මනෝමය ක්‍රියා කිරීම හෝ ක්‍රීඩා කිරීම සඳහා වූ යෝජනා ක්‍රම,
- රීති හෝ ක්‍රම
- ශල්‍යකර්ම මගින් හෝ චිකිත්සාව මගින් මනුෂ්‍ය හෝ සත්ත්ව ශරීරයට ප්‍රතිකාර කිරීමේ ක්‍රම සහ මනුෂ්‍ය හෝ සත්ත්ව සිරුරුවල සිදු කෙරෙන රෝග විනිශ්චය කිරීමෙහිලා ව්‍යවහාරික ක්‍රම
- මහජන සාමය, සදාචාරය ආරක්ෂා කිරීම මානව සත්ත්ව හෝ ශාක ජීවීන් හෝ සෞඛ්‍ය ආරක්ෂා කිරීම හෝ පරිසරයට බරපතළ හානි සිදුවීම වළක්වාලීමට අවශ්‍ය නව නිපැයුම්

### 10.1.1.5 වෙළඳ ලකුණු

යම් ව්‍යාපාරයක නිෂ්පාදිතයක් තවත් ව්‍යාපාරයක නිෂ්පාදිතයකින් වෙන් කොට හඳුනා ගැනීම සඳහා භාවිතා කරනු ලබන යම් ලකුණක්, වචනයක්, සංකේතයක්, උපක්‍රමයක්. වර්ණ, හැඩතල හෝ ඒවායේ සංයෝජනයක් වෙළඳ ලකුණක් ලෙස හැඳින්විය හැකිය.

### 10.1.1.6 භූගෝලීය දර්ශක

යම් භාණ්ඩයක ප්‍රභවය නිශ්චිත ප්‍රදේශයකදී සිදු වූ බවට හඳුනාගත හැකි දර්ශකයක් මෙමගින් අදහස් වේ. යම් භාණ්ඩයක ඇති සුවිශේෂීත්වය එම භාණ්ඩ ප්‍රභවය ලද රට, කලාපය, ප්‍රදේශය වැනි භූගෝලීය සාධකයක් තුළින් ආරෝපණය වී ඇති විටෙක "භූගෝලීය දර්ශක" ඇති වේ. මෙහිදී භාණ්ඩයේ ඇති විශේෂිත ගුණයක්, ලක්ෂණයක් කීර්තිනාමයක් එය නිර්මාණය වූ ප්‍රදේශයේ නම හෝ එහි සුවිශේෂී සලකුණක් සමග පටබැඳ තිබිය යුතුය.

ලෝක වෙළඳ සංවිධානයේ සාමාජික සියලුම රටවල් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි භූගෝලීය දර්ශක ආරක්ෂා කරනු ලැබේ. ඒ අනුව ප්‍රස්තුත භාණ්ඩ එහි තත්‍ය සම්භව ස්ථානය නොවන වෙනත් භූගෝලීය ප්‍රදේශයක සම්භවයක් ඇති විට එම භාණ්ඩයේ භූගෝලීය සම්භවය සම්බන්ධයෙන් මහජනයා නොමග යැවීමට භූගෝලීය දර්ශක මගින් ඉඩ ලබා නොදේ.

උදා: සිලෝන් තේ, ශ්‍රී ලංකා නිල් මැණික්, උඩරට තේ, ශ්‍රී ලංකා කුරුඳු

වෙළඳ ලකුණක් ලියාපදිංචි කිරීමෙන් පසු වසර 10 කට වලංගු වන අතර එහි ලියාපදිංචිය නැවත නැවත අලුත් කළ හැකිය.

ලියාපදිංචි වෙළඳ ලකුණක හිමිකරුට පහත අයිතිවාසිකම් හිමිවේ.

- එම ලකුණෙහි පරම භාවිතය
- ලකුණෙහි ලියාපදිංචිය පැවරීම හෝ අන්සතු කිරීම
- බලපත්‍ර ගිවිසුම්වලට ඇතුළත් වීම

## 10.1.2 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත

පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා පැවති දුර්වල පනත් ඉවත් කොට පාරිභෝගිකයන් කෙරෙහි වැඩි ආරක්ෂණයක් ලබා දීම සඳහා 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත හඳුන්වා දෙන ලදී. වර්තමානයේ පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන මුතා පනත මෙය වන අතර 2003 මාර්තු මස 17 වන දින සිට මෙම පනත ක්‍රියාත්මක වේ.

මෙම පනත පැනවීමේ මූලික අරමුණු අතර පාරිභෝගික කටයුතු පිළිබද අධිකාරිය හා පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව පිහිටුවීම වැදගත් වේ.

### 10.1.2.1 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු

- පාරිභෝගිකයන්ගේ පිවිත වලට සහ දේපළට හානි සිදු වන භාණ්ඩ හෝ සේවා ප්‍රවර්ධනයෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළෙඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් නිසි අවධානය ලබා දීම.
- අසාධාරණ වෙළෙඳ පරිචයන්ට එරෙහිව තහනම් කරන ලද වෙළෙඳ පරිචයන්ට එරෙහිව හෝ පාරිභෝගිකයා සුරා කෑමට ලක් කරන ඕනෑම වෙළෙඳ පරිචයකට එරෙහිව කටයුතු කර
- අලාභ / හානි අය කරගැනීම.

### 10.1.2.2 අධිකාරියේ ප්‍රධාන කාර්යභාරය

- තහනම් කරන ලද වෙළෙඳ පරිචයන් පාලනය කිරීම සහ සහමුලින් ම අවසන් කිරීමට.
- ව්‍යාපාර අතර 'මිල' සම්බන්ධ ඒකඟතා විධිමත් කිරීමට, මිල තත්ත්වය (මිල පාලනය) කිරීමට, දේශීය ආර්ථිකය සහ අන්තර්ජාතික වෙළෙඳාමට හානි සිදු කරන අහිතකර තරගකාරිත්වය වැළැක්වීමට කටයුතු කිරීම.
- තරගකාරිත්වයට එරෙහි පරිචයන් සහ ඒකාධිකාරී බලය අයුතු ලෙස භාවිතා කිරීම විමර්ශනය හෝ ප්‍රශ්න කිරීම (කරගකාරිත්වයට එරෙහි පරිචයන් යනු යම් පුද්ගලයෙකු හෝ පුද්ගල සමුහයක් එක්ව සමාගම් අතර ඇති තරගය අයුතු ලෙස වළක්වමින් ඔවුන් වාසිදායක පරිදි ඔවුන්ගේ වෙළෙඳපොළ කොටස් හෝ ලාභ ඉපයීම පවත්වා ගැනීමයි. මෙහි දී භාණ්ඩ හෝ සේවා අඩු මිලකට සැපයීම හෝ නිසි ප්‍රමිතියෙන් යුක්ත වීම සිදු නොවේ.)
- භාණ්ඩ හා සේවා සපයන්නන් අතර ඵලදායී තරගකාරිත්වයක් පවත්වාගෙන යාම සහ ඊට අනුග්‍රහය දැක්වීම.
- මිල, භාණ්ඩවල උපයෝගීතාවය, ප්‍රමිතිය සහ විවිධත්වයන් සැපයීම වැනි ආනුශාංගික කරුණු සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, භාණ්ඩ ගැනුම්කරුවන්ගේ සහ අනෙකුත් භාණ්ඩ පරිභෝජනය කර්න්නන්ගේ අයිතීන් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම.
- මිලදී ගැනීම සඳහා ඇති භාණ්ඩ සහ සේවාවල ප්‍රමිතිය, ප්‍රමාණය, ශක්‍යතාවය, පිරිසුදු බව, මිනුම් දර්ශක සහ මිල පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කිරීම.
- පනතේ දක්වා ඇති කරුණු පිළිබඳව වන ගැටලු විමර්ශනය කිරීම.

### 10.1.2.3 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ වැදගත් නියමයන්

- වෙළෙන්දෙකු විසින් වාණිජ පරමාර්ථයෙන් අත්පත් කරගත් තමන් භාරයේ ඇති ඕනෑම භාණ්ඩයක්
  - විකිණීම ප්‍රතික්ෂේප කිරීම.
  - ඒ භාණ්ඩය තමා සන්තකයේ තබාගෙන නොමැති බව කියා සිටීම.
  - එම භාණ්ඩයේ පිළිගත මිල හැර වෙනත් කොන්දේසි ඉදිරිපත් කිරීම.
  - ඔහුගේ ප්‍රයෝජනයට අවශ්‍ය ප්‍රමාණයට වඩා අතිරික්ත ප්‍රමාණයක් ළඟ තබා ගැනීම අධිකරණයෙන් දඬුවම් කරනු ලැබිය හැකි වරදකි.

නීතිය ප්‍රකාර සාක්ෂියකින් තොර මිලදී ගැනීමකට පාරිභෝගික ආරක්ෂණය ලබා දිය නොහැකිය. එනිසා මිලදී ගැනීම සම්බන්ධයෙන් කුවිතාන්සියක් ඉල්ලා සිටීමට පාරිභෝගිකයාට අයිතියක් ඇත. එසේ ඉල්ලා සිටින අවස්ථාවලදී

- විකිණීම කළ දිනය
- විකුණන ලද භාණ්ඩවල ප්‍රමාණයන්
- ගෙවන ලද මිල
- වෙළඳාම තොග ද, සිල්ලර ද යන්න දැක්වෙන කුවිතාන්සියක් ගැණුම්කරු වෙත නිකුත් කළ යුතුය.

- පාරිභෝගිකයන්ගේ දැන ගැනීම උදෙසා සෑම වෙළෙන්දෙකුම තම වෙළඳ ආයතනය තුළ විවිධ භාණ්ඩවල මිල දර්ශනයක් ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ.

- අධිකාරිය විසින් නිකුත් කරනු ලබන නිවේදන හා විධානයන් ප්‍රදර්ශනය කිරීම සඳහා දැන්වීම් පුවරුවක් සෑම වෙළෙන්දෙකු විසින්ම තම ව්‍යාපාරික ආයතනය තුළ තැබිය යුතුය. එම නිවේදන ඉවත් කරන, විකෘති කරන පුද්ගලයින් පනත යටතේ වැරදිකරුවන් වේ.
- වෙළෙන්දන් විසින් පාරිභෝගිකයන් නොමඟ යවන සුළු පැවැත්මක නිරත නොවිය යුතුය.
- අධිකාරිය විසින් ඕනෑම වෙළෙන්දෙකු සමඟ
  - භාණ්ඩයේ උපරිම මිල
  - සාදනු ලබන ඕනෑම භාණ්ඩයක ප්‍රමිතිය පිළිබඳව
  - නිෂ්පාදකයා සමඟ එළඹිය යුතුයැයි අදහස් කරන ඕනෑම කොන්දේසියක් පිළිබඳව නියෝග නිකුත් කළ හැකිය.
- අධිකාරිය විසින් නම් කර ඇති භාණ්ඩවල ලේබලයේ භාණ්ඩයේ උපරිම සිල්ලර මිල, නිෂ්පාදන කාණ්ඩ අංකය හා කල් ඉකුත් වන දිනය සඳහන් කළ යුතුය.
- භාණ්ඩ ලකුණු කරන ලද මිලට වඩා වැඩි මිලකට විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම පනත යටතේ වරදක් ලෙස සැලකේ.

**10.1.3 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත**

**10.1.3.1 පනතේ අරමුණු**

- මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම වළක්වාලීම හා එවැනි ගනුදෙනු අනාවරණය කර ගැනීම
- මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදය වැළැක්වීමට අදාළ වැරදි සම්බන්ධ විමර්ශනය කිරීමට හා නඩු පැවරීමට අදාළ බලයලත් අධිකාරියක් පිහිටුවීම.
- මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්ත වාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා නිසි උද්යෝගි පියවර ගැනීමට මුල්‍ය ආයතන වලට නියම කිරීම.

**10.1.3.2 මූල්‍ය බුද්ධි ඒකකය**

2006 අංක 06 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ සංස්ථාපනය කරන ලද අදාළ වැරදි සම්බන්ධ විමර්ශනය කිරීමට හා නඩු පැවරීමට අදාළ බලයලත් අධිකාරිය මූල්‍ය ආයතනය මූල්‍ය බුද්ධි ඒකකයයි.

**10.1.3.2.1 මූල්‍ය බුද්ධි ඒකකයේ අරමුණු/කාර්යයන්**

- මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ ක්‍රම ශක්තිමත් කිරීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැලැක්වීම සඳහා ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වීම
- ශ්‍රී ලංකාව තුල මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ක්‍රම ශක්තිමත් කිරීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා තොරතුරු එක්රැස් කිරීම විශ්ලේෂණය කිරීම හා අදාළ අධිකාරීන්ට උපදෙස් ලබාදීම.
- ශ්‍රී ලංකාව තුල අනුකූලතාවයන් ජාත්‍යන්තර මට්ටමට දියුණු කිරීම මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම හා ජාත්‍යන්තර රෙකමදාරු සහ යහපත් ක්‍රමවේදයන් ශක්තිමත් කිරීම

- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ කාරණා පිළිබඳ ජනතාව දැනුවත් කිරීම හා හැඟීමක් ඇති කිරීම.

**10.1.3.2.2 පනතේ වැදගත් විධිවිධාන**

- **පනතේ 02 වැනි වගන්තියට අනුව**

කිසිදු මූල්‍ය ආයතනයක් විසින් නිර්නාමික ව්‍යාජ නම් වලින් පවත්වාගෙන යන හෝ අංක මඟින් පමණක් හඳුනා ගන්නා ගිණුම් පවත්වා ගෙන නොයා යුතුය

ඒ අනුව මූල්‍ය ආයතන සිය මූල්‍ය සේවා ලබා ගන්නා ගණුදෙණු කරුවන් හොඳින් හඳුනා ගත යුතුය (KYC - Know Your Customer) මූල්‍ය බුද්ධි අංශය විසින් ඊට අදාළ ගණුදෙණුකරුවන් හදුනා ගැනීමේ හා ගණුදෙණුකරු පිළිබඳව නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමට අදාළ රීතීන් පනතේ 2(3) වගන්තිය යටතේ මූල්‍ය ආයතන වෙත නිකුත් කර ඇත. එම රීතීන් ගණුදෙණු කරුවන් හඳුනා ගැනීමේ හා ගණුදෙණු කරු පිළිබඳව නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමට අදාළ 2011 අංක 01 දරන රීතීන් ලෙස හඳුන්වනු ලබයි. එම KYC විධි විධාන අනුව මූල්‍ය ආයතන ගිණුම් විවෘත කිරීමේදී ගණුදෙනුකරුගෙන් පහත තොරතුරු අනාවරණය කරගත යුතුය. බැංකුව විසින් ගණුදෙණු කරු පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු ලබාගෙන ඉන් සෑහීමකට පත්වෙන තුරු එම පුද්ගලයා වෙනුවෙන් කිසිදු බැංකු ගිණුමක් විවෘත නොකළ යුතුය.

**තනි පුද්ගල ගිණුම් විවෘත කිරීම**
**තනි පුද්ගලයෙක් සම්බන්ධව ලබාගත යුතු තොරතුරු**

- සම්පූර්ණ නම හා වෙනත් නම්
- ස්ථාවර ලිපිනය
- බැංකුව සමඟ පවත්වාගෙන යන සබඳතාවයේ ස්වරූපය
- උපන් දිනය, උපන් ස්ථානය
- දුරකතන අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය. ෆැක්ස්
- රැකියාවේ / සේවායෝජකයාගේ විස්තර පොදු තනතුරු දරන්නේ ද යන වග
- වාර්ෂික දළ ආදායම
- අනේවාසික විදේශ ව්‍යවහාර ගිණුම් සම්බන්ධයෙන් විදේශ අධිකරණ බල ප්‍රදේශයක් තුළ ගිණුම් විවෘත කිරීමට හේතුව

**තනි පුද්ගලයෙක් සම්බන්ධව ලබාගත යුතු ලේඛන**
- මැන්ඩේට් පත්‍රය
- අනන්‍යතා ලේඛනයේ පිටපත
- ලිපිනය සත්‍යාපනය කිරීමේ ලේඛනවල පිටපත්
- පුරවැසි නොවන ගිණුම් (RNNFC/NRRA/RGFC) සම්බන්ධයෙන් වලංගු වීසා බලපත්‍රය
- ගිණුම ආරම්භ කරන ලද්දේ යම් ව්‍යාපාර කටයුත්තක් සඳහා නම් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ලේඛනයේ පිටපත්

**සමාගම් ගිණුම් විවෘත කිරීම**

JMC vLearning "your virtual learning partner"

**සමාගම් සම්බන්ධයෙන් ලබාගත යුතු තොරතුරු**

- ව්‍යාපාරික නාමය
- ව්‍යාපාරික ලිපිනය හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය, දුරකතන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය
- සංස්ථාපන සහතිකය සාංගමික ව්‍යවස්ථාවලිය හෝ හවුල් ගිවිසුම
- ව්‍යාපාරයේ ස්වභාවය හා අරමුණු
- ගිණුම මෙහෙය වීමට බලය ලත් පුද්ගලයන්ගේ විස්තර
- බදු ලිපිගොනු අංකය
- අධ්‍යක්ෂකවරුගේ පුද්ගලික විස්තර
- ප්‍රධාන කොටස් හිමියන්/ ඔවුන්ගේ මූල්‍ය සම්බන්ධතා හා පාලන බලය

**සමාගම් සම්බන්ධව ලබාගත යුතු ලේඛන**

- මැන්ඩේට් පත්‍රය
- ගිණුම ආරම්භ කිරීමට සම්මත කරන ලද යෝජනා සම්මතය
- 18 හා 20 ආකෘති පත්‍රවල පිටපත්
- අක්වෙරළ සමාගම්වලට අදාළ 44 හා 45 ආකෘතිවල පිටපත්
- ආයෝජන මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලද ව්‍යාපාරයක් නම් ආයෝජන මණ්ඩල ගිවිසුමේ පිටපතක්
- අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගමක් නම් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අනුමැතිය ලබා දුන් ලිපිය
- තිබේ නම්, අවසන් වරට විගණනය කළ ගිණුම්
-

**ව්‍යාපාර නොවන සමිති සමාගම් සම්බන්ධව ලබාගත යුතු තොරතුරු**

- එම ආයතනයේ අනන්‍යතාවය
- එම ආයතන පවත්වාගෙන යන පුද්ගලයින්ගේ අනන්‍යතාවය
- ගිණුම් අත්සන්කරුවන්ගේ විස්තර හා අනන්‍යතාවය

මෙම රීතීන් අනුව බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන විසින් උක්ත තොරතුරු තහවුරු කර ගැනීම (සත්‍යායනය) සඳහා පහත විකල්ප ක්‍රම වේදයන් භාවිතා කල යුතුය.

- ජාතික හැඳුනුම්පත, උප්පැන්න සහතිකය, විදේශ ගමන් බලපත්‍රය පරීක්ෂා කිරීම මගින් ගණු දෙණුකරුගේ අනන්‍යතාවය හා උපන් දිනය සත්‍යායනය කිරීම
- උපයෝගි බිල්, බැංකු වාර්තා, බදු තක්සේරු වාර්තා, ග්‍රාම නිළධාරී සහතික හෝ ජන්ද හිමි නාමලේඛනය ආදිය හරහා ලිපිය තහවුරු කර ගැනීම
- ගනුදෙනුකරු දුරකතනය, ලිපියක් හෝ විද්‍යුත් තැපෑල හරහා සම්බන්ධ කරගැනීම මඟින් ලබාදී ඇති තොරතුරු සත්‍ය තාවය තහවුරු කර ගැනීම.
- සපයන ලද නිල ලේඛනවල සත්‍යතාව බලයලත් තැනැත්තෙකු මගින් කරනු ලබන සත්‍යායනයක් මඟින් තහවුරු කරගැනීම
- අවශ්‍ය අවස්ථාවන්හිදී නිල ක්ෂේත්‍ර පිරික්සුමක් පැවැත්වීම

සෑම මූල්‍ය ආයතනයක් විසින්ම ඉහළ අවදා නම් පැතිකඩක් ඇති ගණුදෙණු කරුවන් සම්බන්ධයෙන්

JMC vLearning "your virtual learning partner"

පහත අමතර පරීක්ෂණ පැවැත්වීම හෝ අමතර තොරතුරු ලබා ගැනීම සිදු කළ යුතුය

- නිල ක්ෂේත්‍ර පිරික්සුම් මඟින් සිදු කරනු ලබන ගණුදෙණු කරුගේ ස්ථිර ලිපිනය පිළිබඳ සාක්ෂි
- පුද්ගල නිර්දේශ
- ගණුදෙණුකරු පිළිබඳ පූර්ව බැංකු නිර්දේශ
- ගණු දෙණු කරුගේ ධන ප්‍රභවයන් පිළිබඳ තොරතුරු
- හොබවන යම් පූර්ව හෝ වත්මන් රාජ්‍ය තත්වයකට අදාළව ගණුදෙණු කරු සපයන තොරතුරු සත්‍යායනය කිරීම

සෑම මූල්‍ය ආයතනයක් විසින්ම සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා ගත හැකි මෙන්ම කැඳවා ගත නොහැකි දෙආකාරයේම ගණුදෙණුකරුවන් සම්බන්ධයෙන් ප්‍රතිඵලදායී ගණුදෙණු කරු හඳුනා ගැනීමේ ක්‍රියාපටිපාටි අදාළ කරගත යුතුය.

යම් ගනුදෙනුකරුවෙක් ඉහත දක්වන ලද තොරතුරු හා අනන්‍යතාවය හෙළිදරව් නොකරමින් ගනුදෙනුවක් සිදු කිරීමට උත්සහ දරයි නම් ඒ පිළිබඳව එහි මූල්‍ය ආයතන විසින් මූල්‍ය බුද්ධි අංශය දැනුවත් කළ යුතුය.

ගණුදෙණුකරු හඳුනා ගැනීමේ ක්‍රම වේදය තුළ මූල්‍ය ආයතන විසින් රැස්කරගත් තොරතුරු විමර්ශනය කරමින් ගණුදෙණුකරු සම්බන්ධ අවදා නම් හඳුනා ගැනීමත් එසේ හඳුනාගත් ගණුදෙණුකරුවන්ගේ ක්‍රියාකාර්කම් පිළිබඳව අධික්ෂණය කිරීමත් අඛණ්ඩව ගණුදෙණුකරුවන්ගේ සම්ප්‍රජන්‍යතාවය පවත්වා ගැනීම මූල්‍ය ආයතන වල වගකීම විය යුතුය.

### 10.1.3.3 අඛණ්ඩව ගනුදෙනුකරුවන්ගේ සම්ප්‍රජන්‍යතාවය (due deligence) පවත්වා ගැනීම සඳහා මූල්‍ය ආයතන ක්‍රියාවට නැංවිය යුතු කාර්ය පටිපාටිය

- ගණුදෙණු කරුවන් විසින් පසුකාලීනව ඉදිරිපත් කෙරෙන තොරතුරුවල යම් විෂමතාවයක් වේ නම් ඉදිරිපත් කරන ලද තොරතුරුවල සත්‍යය අසත්‍යතාවය තහවුරු කර ගන්නා තෙක් ගිණුම් අත්හිටුවීම.
- ගණුදෙණු කරුවන්ගේ අනන්‍යතා හා සත්‍යායනය කරන ලද ලේඛනවල පිටපත් ගොනුගත කිරීම
- ඉල්ලුම් පත්‍රයේ දී ඇති ස්ථිර ලිපිනය ගිණුම විවෘත කිරීමේ ඉල්ලීම ලද ශාඛාවට ඉතා දුරින් වූ ස්ථානයක පිහිටි අවස්ථාවක වලංගු හේතුවක් ඉදිරිපත් කරන්නේ නම් මිස එම ඉල්ලීම අධෛර්යමත් කිරීම, ඉවත දැමීම හෝ ආසන්නම ශාඛාවේ ගිණුම විවෘත කිරීමට උපදෙස් ලබාදීම සිදු කළ යුතුය.
- යම් ගණුදෙණු කරුවෙක් එකම බැකුවේ ගිණුම් දෙකක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් විවෘත කරන විට එකී ගිණුම් විවෘත කිරීමේ අරමුණ අනාවරණය කරගත යුතුය.
- යම් අපේක්ෂිත ගණුදෙණු කරුයෙකුගේ නම රාජ්‍ය බලධාරීන් නිකුත් කොට ඇති සෝදිසි ලැයිස්තුවක සඳහන් වන්නේ දැයි පරීක්ෂා කළ යුතුය.
- අරමුදල් එක් ගිණුමකින් වෙනත් ගිණුමකට මාරු කරන ලෙස උපදෙස් ලැබුණු විට අදාළ ගිණුම් අංක අනාගත විමර්ෂණ කටයුත්තකට සහය ලබා ගැනීම සඳහා අභ්‍යන්තරව සටහන් කර ගත යුතුය.

JMC vLearning your virtual learning partner

- ශ්‍රී ලංකාවේ පදිංචි පුරවැසි නොවන තැනැත්තන් සඳහා ගිණුම් විවෘත කිරීමේදී ඔවුන් දිවයිනේ
- සිටින කාලය තුළ ස්ථිර ලිපිනය ලෙස දේශීය ලිපිනයක් ලබා ගත යුතුය. ගමන් බලපත්‍රයේ පිටපතක්, වලංගු කාල පරිච්ඡේදය සඳහන් වීසා බලපත්‍රයේ පිටපතක්, ගිණුම විවෘත කරනු ලැබුවේ යම් කාර්යයක් සඳහාද යන සියල්ල ලිපි ගොනුවේ තබා ගැනීමට සැලැස්විය යුතුය.
- වීසා බලපත්‍රය අවසන් වූ විට උචිත උපදෙස් නොලැබුණ හොත් ගිණුමේ කාලය අවසන් වන්නේය. දිවයිනෙන් පිටව යාමේදී ගිණුම වසා දැමීම හෝ අනේවාසික ගිණුමකට මාරු කිරීම සිදු කළ යුතුය.
- දේශපාලනික වශයෙන් අනාවෘත පුද්ගලයන් සඳහා ගිණුම් විවෘත කිරීමේදී ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ අවසර ලබා ගත යුතුය.
- දිවයිනට තුළට ගෙනෙන විදේශ මුදල් ගිණුමක බැරට තැන්පත් කරන අවස්ථාවකදී අරමුදල් ප්‍රභවය පිළිබඳව සෑහීමකට පත්විය යුතුය.
- අනිවාර්ය වාර්තා කිරීමේ නියමයන් මඟ හැරීම සඳහා ගණුදෙණුකරු උත්සහ කරන බව පෙන්නුම් කෙරෙන යම් මුදල් සීමාවකට පහළ නිරන්තර ගණුදෙණු සම්බන්ධයෙන් ආයතනයේ අනුකූලතා නිළධාරියා දැනුවත් කළ යුතුය.
- ගනුදෙනුකරුගේ අසාමාන්‍ය හැසිරීම් පිළිබඳව සොයා බැලිම
- ගනුදෙනුකරුගේ අවදානම පිළිබඳව වර්ග කිරීම සහ අධික සහ මධ්‍යම අවදානමක් ඇති

  ගනුදෙනුකරුවන් පිළිබඳව සොයා බැලීම

**පනතේ 06,07,08 වැනි වගන්තියට අනුව**

බැංකු හා මූල්‍ය ආයතන විසින් පහත ගණුදෙණු පිළිබඳ තොරතුරු මූල්‍ය බුද්ධි අංශය වෙත වාර්තා කළ යුතුය.

- අමාත්‍යවරයා ගැසට් පත්‍රයක් මගින් නියම කළ යම් මුදලක් හෝ ඊට සමාන විදේශ මුදලකින් සිදුවන ගණුදෙණුවක් හෝ විද්‍යුත් මුදල් හුව මාරුවක්
- යම් නීතී විරෝධී කටයුත්තක් හෝ වෙනත් යම් සාපරාධී වරදක් සිදුකිරීමට අදාළ විය හැකියැයි සැක කිරීමට ප්‍රමාණවත් හේතු ඇත්තා වූ ගණු දෙණුවක්
- ත්‍රස්තවාදී ක්‍රියාවක් මගින් ලැබුණු යම් දේපළකට සම්බන්ධ යැයි සිතීමට සාධාරණ හේතු
- ඇත්තා වූ ගණුදෙණුවක් හෝ යෝජිත ගණුදෙණුවක්

**10.1.3.4 සැකකටයුතු ගණුදෙණු වාර්තාව**

පනතේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව යම් නීතී විරෝධී කටයුත්තක් හෝ වෙනත් යම් සාපරාධී වරදක් සිදුකිරීමට අදාළ විය හැකියැයි සැක කිරීමට ප්‍රමාණවත් හේතු ඇත්තා වූ ගණු දෙණුවක් පිළිබඳව යම් මූල්‍ය ආයතනයක් විසින් මූල්‍ය බුද්ධි අංශය වෙත කරනු ලබන දැනුම් දීමක් සැකකටයුතු ගණුදෙණු වාර්තාවක් ලෙස හැඳින්වේ.

එවැනි වාර්තාවක් ලියවිල්ලකින් විය යුතු අතර පැය විසි හතරක් තුළ ලියවිල්ලකින් දැනුම් දීමේ අරමුණින් දුරකථන හෝ විද්‍යුත් මාර්ගයෙන් විය හැකිය. එවැනි වාර්තාවක ගණුදෙණුව පිළිබඳව සැකය ජනිත වීමට හේතුව පැහැදිලි කොට තිබිය යුතුය. පනතේ 12 වන වගන්තිය අනුව මූල්‍ය බුද්ධි අංශය වෙත සැක කටයුතු වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන පුද්ගයෙකු එකී වාර්තාව මත

නඩු පවරනු ලැබීමෙන් මුක්ත කොට ඇත.

### 10.1.3.5 අනුකූලතා නිළධාරී (Compliance Officer)

යම් මූල්‍ය ආයතනයක මෙම පනතේ නියමයන් අනුකූල බවට වග බලාගැනීම සඳහා මූල්‍ය ආයතනයක් විසින් පත්කළ යුතු ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරියා වේ. සෑම මූල්‍ය ආයතනයක් විසින්ම අනුකූලතා නිළධාරියෙකු පත් කළ යුතු බව ගණුදෙණු කරුවන් හදුනා ගැනීමේ හා ගණුදෙණු කරු පිළිබඳව නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමට අදාළ 2011 අංක 01 දරන රීතීන්හි සඳහන් වේ.

### 10.1.4 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත

### 10.1.4.1 පනතේ අරමුණු

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය තහනම් කිරීම සඳහාද, මුදල් විශුද්ධිකරණය මර්ධනය කිරීම සහ වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර සැලැස්වීම සඳහා ද ඒ සම්බන්ධ අනුශංගික කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහාද වූ පනතකි.

### 10.1.4.2 මුදල් විශුද්ධිකරණය

මුදල් විශුද්ධිකරණය යනු යම්කිසි අපරාධ ක්‍රියාවක් මගින් යම්කිසි පුද්ගලයෙකුගේ හෝ ව්‍යාපාරයක ලාභ ප්‍රයෝජන සඳහා උපයන ලද මුදල්වලට ආවරණයක් ලබා දීමයි. නොඑසේ නම් නීතිවිරෝධී ක්‍රියාකාරකම් මඟින් උපයා ගන්නා ලද මුදල්, එහි මූලාශ්‍රය වසන් කිරීමේ අරමුණින් විධිමත් මුදල් සංසරණ පද්ධතියකට ඇතුළත් කිරීමයි. මෙය නොමැනිය හැකි විශාල මාර්ග සංඛ්‍යාවක් ඔස්සේ සිදුවිය හැකිය.

ඒ අනුව නීතිවිරෝධී මාර්ගයකින් උපයා ගන්නා මුදල් ඒ බව දනිමින්ම සන්තකයේ තබා ගැනීම, බැහැර කිරීම, සැගවීම, ලංකාවට ගෙන ඒම, ලංකාවෙන් පිටතට ගෙනයාම මුදල් විශුද්ධිකරණය නම් වරදට අයත් වේ.

මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලිය තුළ ප්‍රධාන අවස්ථා තුනකි.

**ස්ථාපනය**

අපරාධ ක්‍රියා මාර්ග වලින් නිති විරෝධීව උපයා ගන්නා ලද මුදල් මූල්‍ය පද්ධතියට හඳුන්වා දීමයි.

**වත්කම් ඈහිරීම/ සැගවීම**

මෙය ඉතා වැදගත් පියවරකි විශුද්ධිකරණය තුල දේපලක අයිතිය අපරාධ මූල්‍යනයන්ගේ වෙනත් මූලයකට මාරු කිරීම හෝ දුරස්ථ කිරීම මෙහිදී සිදු කරයි

උදා - නීති විරෝධී මූලයකින් උපයාගත් ධනය මුල්‍ය උපකරණ වල ආයෝජනය කිරීම

**ඒකාබද්ධ කිරීම**

මෙය අවසාන පියවරයි. නීති විරෝධී මූලයන්ගෙන් පයාගත් දේපල සාමාන්‍ය ආර්ථික ඉපයුම් ලෙස ආර්ථිකයට නැවත හඳුන්වා දීම සිදු වේ.

JMC vLearning "your virtual learning partner"

### 10.1.4.3 මුදල් විශුද්ධිකරණය සම්බන්ධ දඬුවම්

මුදල් විශුද්ධිකරණයට සම්බන්ධිත දේපළ යැයි සැක කළ හැකි දේපළ පොලිස් නිලධාරියෙකු විසින් තහනමට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ හැකිය. මහාධිකරණ නඩු විභාගයක් අවසානයේ එකී දේපළ රාජසන්තක කිරීමටත්, අදාළ ක්‍රියාකරුට උපරිමය වසරක විසි පහක් දක්වා වූ සිර දඬුවමක් නියම කිරීමටත්, රුපියල් ලක්ෂයක් හෝ අදාළ දේපළ වටිනාකමින් තුන් ගුණය යන දෙකෙන් වැඩි අගය නොඉක්ම වන්නා වූ දඩයක් නියම කිරීමට බලතල ඇත්තේය.

### 10.1.4.4 මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ ගැනෙන අපරාධමය ක්‍රියා

නීති විරෝධී ක්‍රියාකාරකම යන්නෙන් මෙහි පහත සඳහන් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියාවක් අදහස් වේ

- විෂ ද්‍රව්‍ය අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත
- ත්‍රස්තවාදය වැළැක්වීමට අදාළව බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- අල්ලස් පනත
- ගිනි අවි, පුපුරන ද්‍රව්‍ය හෝ අන්තරදායක ආයුධ පනත
- විනිමය පාලන පනත
- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- සයිබර් අපරාධ සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- ළමුන්ට එරෙහි වැරදි හා පුද්ගල ජාවාරම සම්බන්ධයෙන් බලපවත්නා යම් නීතියක් හෝ නියෝගයක්
- මරණීය දණ්ඩණයෙන් හෝ අවුරුදු හතකට වඩා වැඩි කාලයක් සිර දඬුවම් පැමිණි විය හැකි යම් වරදක් සංයුක්ත වන නීතියක්.

### 10.1.4.5 මුදල් විශුද්ධිකරණය සඳහා වන ප්‍රධාන විත්තිවාචක

- **එකඟවීමේ විත්තිවාචකය**
  වරද සිදු වීමට පෙර අදාළ බලධාරීන් වෙත බලයලත් අනාවරණයක් සිදු කරනු ලැබ ඇති සහ ගණුදෙණුව සඳහා කැමැත්ත ලබාගෙන ඇති අවස්ථාවක් මෙයින් අදහස් වේ.
- **සාධාරණ හේතු විත්තිවාචකය**
  අදාළ බලධරයන් වෙත අනාවරණයක් කිරීමට පාර්ශවයන් අදහස් කරනු ලැබුවද සාධාරණ හේතුවක් නිසාවෙන් ඔහුට එසේ කළ නොහැකි අවස්ථා මෙයින් අදහස් වේ.

### 10.1.5 2007 අංක 24) දරණ පරිගණක අපරාධ පනත

පරිගණක ආශ්‍රිත අපරාධ හඳුනා ගැනීමේ, ඒවා විමර්ශනය කිරීමේ සහ වැළැක්වීමේ පරමාර්ථයන් උදෙසා 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පිළිබඳ පනත හඳුන්වා දෙන ලදී.

JMC vLearning "your virtual learning partner"

මෙම පනත ශ්‍රී ලංකාව තුළ සිදු වන වැරදි සඳහා අදාළ වේ. එනම්, පරිගණක පද්ධතිය, අදාළ සේවා සැපයීම, වැරදි හේතුවෙන් උද්ගත වූ පාඩුව හෝ හානිය ශ්‍රී ලංකාව තුළ සිදු විය යුතු අතර එම වරද සිදු කරන ලද පුද්ගලයා ශ්‍රී ලංකාව තුළ සිටිය යුතුය. පුද්ගලයා යන්නට නෛතික පුද්ගලභාවයක් නැති ඕනෑම සංගමයක්, සමිතියක් හෝ සංවිධානයක් ද අදාළ කර ගත හැකි ය.

පනතේ අර්ථ දැක්වීමට අනුව පරිගණකයක් යනු දත්ත සකසන හැකියාව ඇති විද්‍යුත් හෝ ඒ හා සමාන උපකරණයි. පනත යටතේ පහත ක්‍රියාවන් වැරදි වේ.

- පරිගණකයන් වෙත අධිකාරිත්වයක් නොමැති ප්‍රවේශයන් පවත්වා ගැනීම සහ එකී ප්‍රවේශයන් වසන් කිරීම.
- නීතී විරෝධී ක්‍රියාවක් කිරීම සඳහා පරිගණකයක් භාවිතා කිරීම හෝ වරදක් සිදු කිරීමේ පරමාර්ථයෙන් පරිගණකයක් භාවිතා කිරීම.
- පනතේ නිශ්චය කර ඇති පරිදි 'විශේෂිත තොරතුරු විනාශ කිරීම, මකා දැමීම, හානි පැමිණවීම හෝ වෙනස් කිරීම.
- තමාට ළඟා විය නොහැකි දත්තයන් අයුතු පරිදි අත් කර ගැනීම, නිතීවිරෝධී පරිගණක අතුරු උපකරණ භාවිතය හෝ තමාට බලය නොමැති දත්ත අයුතු අයුරින් අනාවරණය කිරීම.
- පරිගණකය භාවිතා කර වැරදි කිරීම, අනුබල දීම හෝ කුමන්ත්‍රණය කිරීම

යම් ආයතනයක සේවයේ නියුතු පුද්ගලයෙකු පරිගණක ආශ්‍රිත වැරදීමක් සිදු කර ඇති විටෙක අදාළ සමාගමේ කළමණාකාරිත්වය ඒ බව නොදැන සිටි නම් හෝ එවන් වැරදි වැළැක්වීම සඳහා ගත යුතු සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති විටෙක හැරෙන්නට සේවකයාගේ ක්‍රියාව සඳහා අදාළ ආයතනය ද සමව වගකිව යුතු ය.

### 10.1.6 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගණුදෙණු පනත

අන්තර්ජාලය හා පරිගණක භාවිතය ඉහළ යාමත් සමග ව්‍යාප්ත වූ විද්‍යුත් ස්වරූපයේ ගණුදෙණු සඳහා නෛතික ආවරණයක් ලබා දීමේ අවශ්‍යතාවයක් ඇති වූ අතර එම අවශ්‍යතාවය සංතෘප්ත කරමින් ඉලෙක්ට්‍රොනික වාණිජ ගණුදෙණු දිරිගැන්වීම සඳහා ඒ පිළිබඳ නීතිය සංගෘහිත කරන ලද පනතක් වශයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙණු පනත හඳුනාගත හැකිය.

**පනතේ ප්‍රධාන අරමුණු**

- විද්‍යුත් ගිවිසුම් හඳුනා ගැනීම හා ඒවාට පහසුකම් සැලසීම.
- විද්‍යුත් ආකෘතියෙන් යුත් පණිවිඩ සහ ලියවිලි නිර්මාණය සහ හුවමාරුව හා සන්නිවේදනය කිරීම.
- සන්තික කිරීමේ අධිකාරියක් පත් කිරීම.
- විද්‍යුත් සේවා සැපයුම්කරුවන් පිළිගැනීමට ලක් කිරීම.

සාමාන්‍ය ගිවිසුමක් නීතිය ඉදිරියේ වලංගු වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා වන සන්නිවේදනය වී තිබිය යුතු වීම, මුල් ආකෘතියෙන් ම පැවතිය යුතුය වැනි අවශ්‍යතා විද්‍යුත් ගණුදෙණුවකදී සංතෘප්ත නොවීම විද්‍යුත් ගණු දෙණු සම්බන්ධයෙන් මුහුණ පෑමට සිදුවන ප්‍රධානතම ගැටලුවකි. එම ලක්ෂණ විද්‍යුත් ගිවිසුමකදී ඉෂ්ඨ වීම අවිනිශ්චිත වන බැවින් සාම්ප්‍රදායික නීතීන් යටතේ විද්‍යුත් ගිවිසුම් සඳහා නෛතික පිළිගැනීමක් නොවීය.

JMC vLearning
"your virtual learning partner"

කෙසේ නමුත් ඉලෙක්ට්‍රොනික ගණුදෙණු පනතේ 4 වන වගන්තියට අනුව දත්ත පණිවුඩ විද්‍යුත් ලියවිලිල විද්‍යුත් වාර්තා හෝ අනෙකුත් විද්‍යුත් සන්නිවේදන විධික්‍රම අඛණ්ඩව එහි ඇති දත්තයන් උදෙසා ප්‍රවේශය සලසනවා නම් එවන් විද්‍යුත් සන්නිවේදන ක්‍රම උක්ත දක්වා ඇති සාමාන්‍ය ගිවිසුම්වල අවශ්‍යතා තෘප්ත කර ඇති බව සැලකිය හැකි වේ. එසේම පනතේ (7) වන වගන්තිය දක්වන ආකාරයට ශ්‍රී ලංකාවේ යම් පනතකින් හෝ නෛතික ලියවිල්ලක් හරහා යම් තොරතුරක් හෝ සන්නිවේදනයක් අත්සනක් හරහා සහතික කළ යුතු බවට අවශ්‍යතාවයක් දක්වා ඇති විටෙක විද්‍යුත් ලියවිලි සහ විද්‍යුත් සන්නිවේදන ක්‍රමයක අඩංගු දත්ත සහතික කිරීමට 'විද්‍යුත් අත්සනක් ' වලංගු වේ.

'විද්‍යුත් ගිවිසුම් ' යනු පාර්ශවයන් අතර විද්‍යුත් මාධ්‍ය හරහා අර්පණය ප්‍රතිග්‍රහණය සිදු වී ගිවිසුමක් නිර්මාණය වීමයි.

විද්‍යුත් සන්නිවේදනය' යනු යම් පණිවිඩයක් නිර්මාණය කරන ලද පුද්ගලයා විසින් ස්වයංක්‍රීය විද්‍යුත් වැඩසටහනක් / පද්ධතියක් ඔස්සේ 'ලබන්නා' වෙත එය යැවීමයි.

**විද්‍යුත් පණිවුඩයක් සන්නිවේදනය වන අවස්ථාව**

විද්‍යුත් පණිවුඩයක් සන්නිවේදනයේ ආරම්භය (උත්පාදකයාගෙන් පිටත් වීම) සිදු වන්නේ එය උත්පාදකයාගේ පාලනයෙන් බැහැර තොරතුරු පද්ධතියක් වෙත ඇතුළු වූ වහාමය. එනම් උත්පාදකයා පාලනය නොකරන්නා වූ යම් සන්නිවේදන පද්ධතියකට එය ඇතුළු වී ලබන්නා විසින් එය ලබා ගත් පසුව වුවද එම පණිවිඩය එකී සන්නිවේදන පද්ධතියේ ම පැවතීම තුළ ද සන්නිවේදනය සිදු වී ඇති බවට නිශ්චය කළ හැකිය. පණිවුඩයේ උත්පාදකයා විසින් තම පණිවුඩය ලබාගැනීමේ දී ලබන්නා විසින් එම පණිවුඩයට උත්පාදකයාගේ ලදුපතක් ලබාගෙන ඉදිරිපත් කළ යුතු බවට නියම කර ඇති විටෙක ලබන්නා අදාළ ලදුපත ඉදිරිපත් නොකළේ නම් එවන් විටෙක උත්පාදකයා ලබන්නා වෙත පණිවුඩයක් නොයැවූ බවට සලකනු ලබයි.

සාමාන්‍ය ජනතාව අතර විද්‍යුත් තොරතුරු පණිවිඩල විද්‍යුත් ලියවිලි, විද්‍යුත් වාර්තා හා අනෙකුත් විද්‍යුත් සන්නිවේදන ක්‍රමයන්හි සත්‍යතාවය, විශ්වසනීයත්වය සහ නිරවද්‍යතාවය පිළිබඳව විශ්වාසයක් ඇති කිරීම පිණිස පනත යටතේ මේ සම්බන්ධව 'සහතික කිරීමේ අධිකාරියක්' ඇති කරන ලදී.

**ඉලෙක්ට්‍රොනික ගණුදෙණු පනතේ ආවරණයෙන් බැහැර අවස්ථා**

- අන්තිම කැමතිපත්‍ර හා තෙස්තමේන්තු නීයාදනයන්
- විදුලි සංදේශ පද්ධතියක් සඳහා වූ බලපත්‍ර
- ඇටෝර්නි බලපත්‍ර
- භාර
- විනිමය බිල්පත්‍ර
- නිශ්චල දේපළ සම්බන්ධිත ලේඛන

ඒ අනුව ඉහත දක්වන ලද කාරණාවන් සම්බන්ධයෙන් විද්‍යුත් ලේඛන නීතිය ඉදිරියේ වලංගු නොවේ.